හැඳින්වීම

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාසයේ පිහිටියා වූ වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය වර්ග කිලෝමීටර 210.6 ක විශාලත්තවයෙන් යුක්ත වේ. කලුතර දිස්ත්‍රික්කයේ විශාලතම භූමි ප්‍රදේශයක පිහිටි මෙම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 60 කින් සමන්විතවේ.

වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙකී ග්‍රාම නිලධාරී කොට්ඨාස 60 අතරින් පැලවත්ත නැගෙනහිර (850-B) ග්‍රාම නිලධාරී වසම ඉතා සුවිශේෂී වසමකි. මිගහතැන්න උපත්,විවාහ,මරණ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අයත් පැලවත්ත ගොවි ජන සේවා බල ප්‍රදේශයට අයත් එමෙන්ම පැලවත්ත සමෘධි කලාපයට අයත් මෙම ග්‍රාම නිළධාරී වසම එපිටවල, ගල්කඩුව, වනහලුගොඩ, කඳිරන්දොළ, ගල් බොරළුව යන ග්‍රාමයන්ගෙන් සමන්විතයි. මූලිකවම පැලවත්ත නගරය කේන්ද්‍ර කොට ගනිමින් කෘෂිකර්මයට මූලික තැනක් දෙමින් මෙම ප්‍රදේශයේ ජනතාව තම දෛනික කටයුතු සිදුකරනු ලැබේ.

කඳු හෙල්, තෙත් බිම්වලින් ගහණ වූ මෙම වසම ස්භාවික සම්පත් හා විශාල ශ්‍රම බලකායකින් සමන්විත වන අතර යහපත් දේශගුණික තත්වයන්ගෙන් යුක්ත,සමස්ථයක් වශයෙන් කදු, නිමින, තැනිතලාවන්ගෙන් සමන්විත වන අතර හා වර්ෂය පුරා පැතිරුණු අධික වර්ෂාපතනයක් ලැබෙන කලාපයකි.

පිහිටීම මූල්කරගත් තොරතුරු

පිහිටීම

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාසයේ පිහිටියා වූ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වර්ග කිලෝමීටර 210.6 ක විශාලත්වයකින් යුක්තවේ. කළුතර දිස්ත්‍රික්කයේ විශාලතම භූමි ප්‍රදේශයක පිහිටි මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිළධාරී වසම් 60කින් සමන්විත වේ.

850බී පැලවත්ත නැගෙනහිර ග්‍රාම නිළධාරී වසමේ පිහිටීම පිළිබඳ සලකා බැලීමේදී උතුරින් 843 අයි රණේපුරගොඩ ග්‍රාම නිළධාරී වසමෙන්ද, දකුණින් 850 ඒ, මිරිස්වත්ත ග්‍රාම නිළධාරී වසමෙන්ද , නැගෙනහිරින් 843 ජී පහළ හෙවෙස්ස දකුණ ග්‍රාම නිළධාරී වසමෙන්ද බටහිරින් 850 පැලවත්ත ග්‍රාම නිළධාරී වසමෙන්ද මායිම් වී ඇත.

විශාලත්වය

ඉතා සුන්දර භූමිභාගයක පිහිටියාවූ මෙම 850 බී පැලවත්ත නැගෙනහිර ග්‍රාම නිළධාරී වසම හෙක්ටයාර 225ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්ත වේ. මෙයින් බහුතර ඉඩම් ප්‍රමාණයක් වී, තේ, රබර්, කුරුඳු බෝග වලට යොදාගෙන ඇත. (මෙම භූමි ප්‍රමාණය තුළ හෙක්ටයාරයකට 3.53 ක ජන ඝණත්වයක් දක්නට ලැබේ.)

භූ විෂමතාවය

මෙම ග්‍රාම නිළධාරී වසම මඳ කඳු සිහිත තැනිතලා භූමියකින් යුක්ත ප්‍රදේශයකි. විශේෂයෙන්ම වී වගාවට යෝග්‍ය භූ ලක්ෂණයන්ගෙන් සමන්විත වන අතර කඳුකර ප්‍රදේශවල තේ, රබර්, කුරුඳු වලට ද යෝග්‍ය භූ ලක්ෂණ දැකගත හැකිය. විශේෂයෙන්ම මනුෂ්‍ය වාසයට ඉතා සුදුසු භූමියක් ලෙස මෙම ප්‍රදේශය හැඳින්විය හැකිය.

මාර්ග හා ජල වහනය

වසමට අදාළ ප්‍රධාන මහා මාර්ගය පැලවත්ත නෙළුව මාර්ගයයි. ඊට අමතරව පැලවත්ත පහළ හෙවෙස්ස මාර්ගය ද ප්‍රධාන වේ. එම මාර්ග දෙක හා සම්බන්ධ වෙමින් ග්‍රාමය තුල විහිදුණු අතුරු මාර්ග පද්ධතියක් ද වෙයි. එපිටවල පාර, කඳිරංදොළ පාර, ගල්බොරලුව පාර, අකුළහේන පාර, එපිටවල මැද පාර, මැදිගොඩ පාර, යන පාරවල් එම මාර්ග පද්ධතියට අයත් වේ.

ජලවහන පද්ධතිය ප්‍රධාන වශයෙන්ම සකස්වනුයේ හෙවෙස්ස ඇල මූලික කරගෙනය. ඊට ගලාබස්නා කුඩා කුඩා දියපාරවල් කිහිපයකින් ප්‍රදේශය තුළ ජලවහනය සිදුවේ.

වසමට ළඟාවිය හැකි ප්‍රධාන මාර්ග

ප්‍රධාන වශයෙන්ම පැලවත්ත නගරයේ සිට පිටිගල මාර්ගයේ ගොරකදුව මංසන්ධියෙන් නෙළුව මාර්ගයට පිවිසිවිට ද, පැලවත්ත නගරයෙන් පහළ හෙවෙස්ස මාර්ගයෙන්ද, 850 බී- පැලවත්ත නැගෙනහිර ග්‍රාම නිළධාරී වසමට ළඟාවිට හැකිය.

වර්ෂාපතනය

මෙම කොට්ඨාසය තෙත් කලාපයේ පිහිටීමත් සාගරයට ආසන්න වීමත් නිසා වර්ෂය පුරා අධික වර්ෂාපතනයක් දක්නට ලැබේ. වර්ෂාව දක්නට ලැබෙන ප්‍රධාන කාලපරිච්ඡේදය, නිරිතදිග මෝසමේ ක්‍රියාත්මකවන කාල සීමාව වන අතර, ඊසාන දිග මෝසමේ සහ වංවහන ධාරා ක්‍රියාත්මක වන කාලය තුලදී ද සැලකිය යුතු වර්ෂාපතනයක් දක්නට ලැබේ.

- **වසමේ නම හැදුණු ආකාරයෙ-**

ඈත අතීතයේ මෙම ප්‍රදේශයේ බහුලව මිනිරන් කර්මාන්තය සිදුකොට තිබේ. වර්තමාන අන්නාසිගලහේන ප්‍රදේශයේ අතීතයේ මිනිරන් තිබී ඇත. එම මිනිරන් මිලදී ගැනීමටත්, මිනිරන් පතල් හැරීමටත් බෙන්තර සිට මිනිසුන් පැමිණ ඇත. මොවුන් පැමිණ ඇත්තේ පැලවත්ත ගඟ ඔස්සේ බවද විශ්වාස කෙරේ. ඔවුන් එම කර්මාන්තයේ යෙදීමට පැල (කුඩාරම්) අටවා ගෙන සිට ඇත්තේ මෙම ප්‍රදේශයේය. පැල අටවාගෙන සිටි වත්ත පැලවත්ත වූ බවට ජනප්‍රවාදයේ පවතී. එසේ බෙන්තරින් පැමිණි පිරිස හෙට්ටිආරච්චි පරම්පරාවට අයත් වූ අතර ඔවුන් පදිංචි වූ තැන හෙට්ටිගොඩ නම් විය. එසේම මෙම ප්‍රදේශයේ පදිංචිව සිටි පිරිස සමඟ අවාහ විවාහ වී ගුණවර්ධන පරම්පරාව ද ආරම්භ වී ඇත. මෙසේ බිහිවූ පැලවත්ත ග්‍රාමය පසුකාලීනව සිදුකරන ලද පරිපාලන බෙදීම් අනුව කොටස් කිහිපයකට බෙදුණු අතර ඒ අනුව පැලවත්ත නැගෙනහිර ග්‍රාමය ආරම්භ විය.